# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2019 අප්‍රේල්


**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය**

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk


ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, 2019 අප්‍රේල් මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 3.6%ක් බව ප්‍රකාශ කළේය. පසුගිය මාර්තු මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2.9%ක් ලෙස වාර්තා විය. 2019 අප්‍රේල් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -0.5%ක හා ආහාර නොවන කාණ්ඩයේ 4.1%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2018 අප්‍රේල් මාසයේ 1.6% ක්වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය -0.1%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 1.7%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2019 මාර්තු මාසයේ 126.4ක් වූ දර්ශකාංකය 2019 අප්‍රේල් මාසයේ 127.3 දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2019 අප්‍රේල් මාසයේ දර්ශකාංකය 0.9ක වැඩිවීමක් එනම් 0.7ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.39%කින් වැඩිවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.35%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා එළවළු, කිරිපිටි, අර්තාපල්, අළුත් මාළු, දෙහි, ලොකුළූණු, කෙසෙල්, බිත්තර, කුකුල් මස්, පොල්තෙල් සහ වියළි හාල්මැස්සන් යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීම බලපා ඇත. එසේ වුවත් පැපොල්, සහල්, අමු මිරිස්, සුදුළූණු සහ පොල් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2019 අප්‍රේල් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (බුලත්, සිගරට්, පුවක් සහ අරක්කු), 'ප්‍රවාහන' (වාහන මිළදී ගැනීම, ඉන්ධන මිල, ගුවන් ගමන් ගාස්තු), 'විවිධ භාණ්ඩ හා සේවා', 'රෙදිපිළි හා පාවහන්' 'සෞඛ්‍ය' (වෛද්‍ය රසායනාගාර පරීක්ෂණ සඳහා ගෙවීම්) සහ 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. තවද 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ 'සන්නිවේදන'කාණ්ඩවල වියදම්වල වටිනාකම සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'අධ්‍යාපන' සහ 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වෙනස් වී නොමැත.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2018** | අප්‍රේල් | **122.9** | **0.1** | **1.6** |
| | මැයි | **124.3** | **1.1** | **2.1** |
| | ජූනි | **126.5** | **1.8** | **2.5** |
| | ජූලි | **126.6** | **0.1** | **3.4** |
| | අගෝස්තු | **125.4** | **-0.9** | **2.5** |
| | සැප්තැම්බර් | **124.4** | **-0.8** | **0.9** |
| | ඔක්තෝම්බර් | **124.9** | **0.4** | **0.1** |
| | නොවැම්බර් | **127.7** | **2.2** | **1.0** |
| | දෙසැම්බර් | **127.1** | **-0.5** | **0.4** |
| **2019** | ජනවාරි | **127.3** | **0.2** | **1.2** |
| | පෙබරවාරි | **126.7** | **-0.5** | **2.4** |
| | මාර්තු | **126.4** | **-0.2** | **2.9** |
| | අප්‍රේල් | **127.3** | **0.7** | **3.6** |